**ශීර්ෂය 336 - වෙළඳ නාවික ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 336 - වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 23 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ලේකම් කාර්යාලය 2021 වර්ෂයේ දී වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘතියක් ලෙස ස්ථාපනය කර තිබුණු බැවින් සහ 2022 වර්ෂයේ සිට වෙනම වැය ශීර්ෂයක් යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින් ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමක් සිදු කර නොතිබුණි. එබැවින් ඉකුත් වර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ නොතිබුණි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ 30 (SA-30) අනුව තැන්පතු ගිණුමේ වර්ෂයට අදාල තැන්පතු ලැබීම් හා තැන්පතු ගෙවීම් වටිනාකමක් ඇතුළත් ව නොමැති නමුත්, ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පතු ලැබීම් ලෙස රු.669,450 ක් සහ තැන්පතු ගෙවීම් ලෙස රු.669,450 ක් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ පොදු තැන්පත් ගනුදෙනු CIGAS හි ශීර්ෂ අංක 176 යටතේ ඇති පොදු තැන්පත් ගිණුම් අංක 6000-0-0-18-0-118 ට ගිණුම් ගත කර ඇති අතර, එය ශීර්ෂ අංක 336 යටතේ වූ පොදු තැන්පත් ගිණුම් අංක 6000-0-0-18-0-180 වෙත ගිණුම් ගත කළ යුතුය.<br>එය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය මාරු පත්‍ර සකස් කළද, වර්ෂ අවසානයේදී TR Code activate කිරීම සිදු නොකිරීම හේතුවෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු නොවීය. | 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |

**(ආ) අග්‍රිම ශේෂය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ (ACA-7) වෙනත් ආයතන විසින් වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද රු.54,476 ක මුදල 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශයේ ACA-2(ii) දක්වා නොතිබුණි. | වෙනත් ආයතන විසින් දරන ලද වියදම් ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි ගළපා ඇති බැවින් ACA-2 (ii) ආකෘතිය සඳහා ගැළපිය යුතු බව මගහැරී ඇත. මේ පිළිබඳව අදාළ විෂය භාර නිලධාරියා දැනුවත් කර උපදෙස් දෙන ලදී. | දත්ත නිවැරදිව සහ සම්පූර්ණ ලෙස ඇතුළත් කරමින් සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |
| **(ii)** | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ (ACA-7) අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් දරන ලද වියදම රු. 6,978,240 ක් ලෙස දක්වා තිබුණද, සිගාස් ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරන ආයතනය දරන ලද වියදම් ලෙස රු.6,976,901 ක් දක්වා තිබුණි. | 2022 වර්ෂය තුළදී ආදායම් ගිණුම් අතර සිදුවූ ගැළපීමක් මූල්‍ය ප්‍රකාශන පෙර වැඩ වලදී දෙවරක් ගලපා ඇති අතර, එය ද ගැළපීමේ ද්විත්ව සටහනෙහි බලපෑම හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇත. | 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ නිවැරදිව සකස් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ මඟපෙන්වීම්වල 7.9 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාලසීමාව අවසානයේ එක් එක් වාර්තාකරණ ආයතනය විසින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද මුදල් ශේෂය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ හි ශේෂයට ඇතුලත් නොකළ යුතු බවට උපදෙස් ලබා දී ඇතත්, වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද රු.39,670,090 ක වටිනාකම, 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ හි ශේෂයට ඇතුළත් කර තිබුණි. | මෙම තත්ත්වය මූල්‍ය ප්‍රකාශන මඟ පෙන්වීම් නිසියාකාරව පැහැදිලි නොවීම නිසා සිදුවූවක් වන අතර, නැවත එවැනි අත්වැරදීම් සිදු නොවීමට අදාළ විෂය භාර නිලධාරියා දැනුවත් කර උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 ජුලි 22 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 3 ඡේදයේ සඳහන් පරිදි වෙනස්වන ආර්ථික තත්ත්වයේ සහ සත්‍ය ආදායම් ක්‍රියාකාරීත්වය මත ආදායම් ඇස්තමේන්තු අඛණ්ඩව සංශෝධනය කළ යුතු වුවත්, ඊට අනුකූල නොවීම හේතුවෙන් ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ සත්‍ය ආදායම, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 66 කින් වැඩි වී තිබුණි. | වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් රැස් කරන ලද ආදායම අධ්‍යක්ෂ ජනරාල් නමින් 2022 සැප්තැම්බර් 8 දින සිට නව ආදායම් ශීර්ෂයක් යටතේ එකතු කිරීම සිදුකරනු ලබයි. එම නිසා වාර්ෂික ගිණුම් සකස් කිරීමේදී සැප්තැම්බර් 8 දිනෙන් පසුව එකතු කරන ලද ආදායම පමණක් අධ්‍යක්ෂ ජනරාල් නමින් ගිණුම් ගත කර ඇත. තවද නොවැම්බර්, දෙසැම්බර් මාස වලදී බලපත්‍ර අළුත් කිරීමට පැමිණෙන පිරිස වැඩිවීමෙන් අවසන් කාර්තුවේදී එකතු කරන ලද ආදායම වැඩි වී ඇත. 2023 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව මුදල් රෙගුලාසි 85(I) (ඇ) ප්‍රකාරව වඩාත් නිවැරදි ලෙස සකස් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ලේකම් කාර්යාලය විසින් ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු බව. |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලේකම් කාර්යාලයේ 2022 වර්ෂයේ වැය ලෙජරයන් පරික්ෂාවේදී වැය විෂයයන්ට අදාළ නොවන වියදම් ඇතුළත් කිරිම හේතුවෙන් එම වියදම් වැය විෂයන්හි වියදම් අඩුවෙන්/ වැඩියෙන් දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ. | | |
| (i) | 1409 වැය විෂයයට ඇතුළත් වියයුතු අවස්ථා 04ක වියදම් වටිනාකම රු.268,448 ක් වුවද එම වැය විෂයයෙහි ඉතිරිය රු.40,960 ක් වූයෙන් එම වැය විෂයයේ ප්‍රතිපාදන ඉක්මවා රු.227,488 ක් වියදම් දරා තිබුණි. | යාපනය උප කාර්යාලයට අදාළ ආරක්ෂක සේවය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන් පසු සිදු කිරීම ද, අයවැය ඇස්තමේන්තුව තුළින් ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන හා සාපේක්ෂව ප්‍රමාණවත් ප්‍රතිපාදන අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකිරීම ද යන හේතුන් නිසා 336-2-1-0-1409 වැය විෂයය සඳහා වූ ප්‍රතිපාදන ඉක්මවීම සිදු වී ඇත. | මු.රෙ. 50 හි සඳහන් ආකාරයට නිසි පරිදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |
| (ii) | 1403 විදුලිය හා ජලය වැය විෂයයට රු.153,489 ක් ගිණුම්ගත විය යුතුව පැවතුණද, එම වැය විෂයයන්හි ඉතිරිය රු.2,272 ක් වූයෙන් වැය විෂයයේ ප්‍රතිපාදන ඉක්මවා රු.151,217 ක් වියදම් දරා තිබුණි. | 2022 වර්ෂය තුළදී රජයේ ජල බිල්පත් ගාස්තු වැඩි වීම හේතුවෙන් 336-2-1-1403 වැය විෂයය සඳහා අනුමත ප්‍රතිපාදන ඉක්මවීම සිදු වී ඇත. | මු.රෙ. 50 හි සඳහන් ආකාරයට නිසි පරිදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |
| (ආ) | මු.රෙ.66 යටතේ මාරු කරගත් ප්‍රතිපාදන අනුව වර්ෂය අවසන් වනවිටත් වැය විෂයයන් 04 ක රු.1,430,062 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරිව පැවති අතර, සංශෝධිත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස ඉතිරිය සියයට 25 සිට සියයට 151 ක් දක්වා වූ පරාසයක පැවතුණි. | වර්ෂයේ ආරම්භයේ දී කාර්තු පදනම මත ප්‍රතිපාදන ලබා දුන් අතර අවසන් කාර්තුව වන විට 2022 සංශෝධිත අයවැය මගින් 2022 වර්ෂය සඳහා අමතර ප්‍රතිපාදන සහිත අයවැය හඳුන්වා දුන්නද, ඒ වන විටත් පළමු, දෙවන හා තුන්වන කාර්තුවල වියදම් දරා තිබුණු බැවින් වැඩිපුර ප්‍රතිපාදන එම වැය ශීර්ෂයන්හි ඉතිරි වී ඇත. | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව සිදු කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 74 ක් දක්වා ඉතිරියක් සහිත පුනරාවර්තන වැය විෂයයන් 08 ක රු.1,678,360 ක් උපයෝජනය කර නොතිබුණි. | අයවැය චක්‍රලේඛ 3/2021 හා 3/2022 ප්‍රකාරව වියදම් සීමා කිරීම හේතුවෙන් මෙම ඉතිරිවීම් ඇති වී තිබුණි. | මු.රෙ. 50 හි සඳහන් ආකාරයට නිසි පරිදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |

**2.3** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (ඇමුණුම-iii) සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශය ACA-2 (ii) අනුව වැය විෂයන් 02 ක් සඳහා ඉතිරිය ඉක්මවූ රු.257,759 ක බැරකම් වලට එළඹ තිබුණි. | 2022 වර්ෂයට අදාළ මුල්‍යා ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී ගිණුම් අංශයට ලැබී තිබූ වවුචර්පත් විශ්ලේෂණයෙන් අදාළ බැරකම් හඳුනා ගත් අතර, විගණන විමසුමෙහි සඳහන් වියදම් වලට අදාළ වවුචර්පත්, මුල්‍යා ප්‍රකාශන පිළියෙල කිරීම අවසන් වූ පසු ලද ඒවා වේ. | මු.රෙ.94 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව ලේකම් කාර්යාලය විසින් බැරකම්වලට නොඑළඹිය යුතු බව. |
| (ආ) | විගණන නියැදි පරීක්ෂාව අනුව 2022 වර්ෂය සඳහා අවස්ථා 07කට අදාළව රු.374,042 ක බැරකම් 2023 පළමු මාස 3 දී නිරවුල් කර තිබුණු අතර, මෙම වියදම් 2022 දෙසැම්බර් 31 දිනට වූ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැරකම් ලෙස ඇතුළත් කර නොතිබුණු අතර එයින් වැය විෂයයන් 2 කට අදාළව රු.51,542 ක් ඉතිරිය ඉක්මවා තිබුණි. | 2022 වර්ෂයට අදාළ මුල්‍යා ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී ගිණුම් අංශයට ලැබී තිබූ වවුචර්පත් විශ්ලේෂණයෙන් අදාළ බැරකම් හඳුනා ගත් අතර, විගණන විමසුමෙහි සඳහන් වියදම්වලට අදාළ වවුචර්පත්, මුල්‍යා ප්‍රකාශන පිළියෙළ කිරීම අවසන් වූ පසු ලද ඒවා වේ. | සියළු බැරකම් මූල්‍යා ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර මු.රෙ.94 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව ලේකම් කාර්යාලය විසින් බැරකම් වලට නොඑළඹිය යුතු බව. |

**2.4** **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ලේකම් කාර්යාලයේ මූල්‍යා පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන | වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගෙන යාමට අදාළව අභ්‍යන්තර විගණනය සිදු කරනු ලබයි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |

යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බව දක්වා ඇති නමුත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 – 3.3 ඡේදය | ලේකම් කාර්යාලයේ වාහන වල ඉන්ධන භාවිතය හා දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ සටහනක් පවත්වාගෙන යා යුතු වුවත් එසේ පවත්වා ගෙන ගොස් නොතිබුණි. | වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වාහනවල ඉන්ධන භාවිතය හා දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවක් සහ එයට අදාළ ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2017 ජුනි 28 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 01/2017 | මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම සම්බන්ධයෙන් සපයා ඇති තොරතුරු අනුව අදාළ කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත වාර්තා කල යුතු වුවද, ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ SA-82 ආකෘතියේ දේපල පිරියත හා උපකරණවල රු.94,915,801 ක වටිනාකමින් යුත් වත්කම්වලට අදාල විස්තර කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ලේඛනගත කිරීම දැනටමත් කරමින් පවතින අතර ඉදිරියේදී අදාළ සියළු විස්තර කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත යැවීමට කටයුතු යොදමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 04 ඡේදය | ගණන්දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ ප්‍රග්ධන හා පුනරාවර්තන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | දැනට වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ කාර්යයන් පිළිබඳ ක්‍රියාකාරි සැලැස්මක් සකස් කරමින් පවති. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ අංක 12 ක්‍රියාකාරී සැලැස්ම තුල, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත විය යුතු වුවත් එම කරුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. තවද අදාල වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමවුම්/ප්‍රතිඵල (Output/Outcome) ඇතුළත් විය යුතු වුවද, ඊට අනුකූලව විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් ලේකම් කාර්යාලය විසින් සකස් කර නොතිබුණි. | 2022 ක්‍රියාකාරී සැලැස්ම තුළ ප්‍රධාන ආයතනික කාර්යයන් සඳහා වන අක්මුදල් අවශ්‍යතාවය, කාල රාමුවට අපේක්ෂිත නිමවුම් හෝ ප්‍රතිඵල ඇතුලත් කර සකස් කර ඇත. එම ක්‍රියාකාරී සැලැස්මෙහි පිටපතක් මෙයට අමුණා ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව විධිමත් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලේකම් කාර්යාලයේ දැක්ම,මෙහෙවර හා අරමුණු ඉටුකර ගැනීම සඳහා ආයතනයේ ප්‍රධාන කාර්යයන් ඉටු කර ගැනීමට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම විධිමත් ලෙස සකස් කල යුතු වුවද, ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද එක් ව්‍යාපෘතියක් වන " ILO සම්මුතියට අනුකූලව ජෛවමිතික අංග එකතු කරමින් සියලුම ශ්‍රී ලාංකික නාවිකයන්ට හැඳුනුම්පත් නිකුත් කිරීම (SID)" ට සම්බන්ධ ක්‍රියාකාරකම පමණක් අදාල ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති අතර, 2022 වර්ෂයට අදාළ වෙනත් කිසිදු ක්‍රියාකාරකමක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | 2022 වර්ෂයේදී අයවැය මගින් ප්‍රතිපාදන ලබා දී ඇති ව්‍යාපෘති සඳහා පමණක් ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ඇත. ආයතනයේ ප්‍රධාන කාර්යයන් සඳහා ක්‍රියාකාරි සැලැස්මක් දැනට සකස් කරමින් පවතී. | දැක්ම,මෙහෙවර හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවන පරිදි ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් ඉටු කර ගැනීමට අදාළ ක්‍රියාකාරකම් ඇතුලත් කරමින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට පියවර ගත යුතු බව. |
| (ඇ) | වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ 2022 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව ප්‍රධාන කාර්යයන් 12 ක් හා කෙටිකාලීන සැලසුම් 4 ක් අපේක්ෂිත ඉලක්ක ලෙස දක්වා තිබුණද එම ප්‍රධාන කාර්යයන් හා ඉලක්ක, ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොමැති වීම හේතුවෙන් ලේකම් කාර්යාලයේ කාර්යසාධනය පරික්ෂා කිරිමට නොහැකි විය. | 2022 වර්ෂයේදී අයවැය මගින් ප්‍රතිපාදන ලබා දී ඇති ව්‍යාපෘති සඳහා පමණක් ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ඇත. ආයතනයේ ප්‍රධාන කාර්යයන් සඳහා ක්‍රියාකාරි සැලැස්මක් දැනට සකස් කරමින් පවතී. | ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් හා අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගත හැකිවන පරිදි රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට පියවර ගත යුතු බව. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය මගින් වෙළඳ නාවික ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති වාහන 03 ක් පවතින අතර මෙම වාහන ලේකම් කාර්යාලය නමින් පවරාගෙන ගිණුම්වලට ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | වාහන 3 ක් වරාය ,නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් වෙළඳ නාවික ලේකම් කාර්යාලය වෙත තාවකාලිකව අනුයුක්ත කර ඇති අතර එම වාහන මෙම කාර්යාලයට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | විධිමත් ක්‍රියාපටිපාටීන් අනුව වත්කම් පවරා ගෙන එම වත්කම් නිවැරදිව ගිණුම් ගත කිරීමට ලේකම් කාර්යාලය විසින් කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වූ මඟපෙන්වීම් යටතේ 8.2 ඡේදය ප්‍රකාරව "තවදුරටත් වාර්තා කල යුතු මූල්‍ය නොවන වත්කම් තිබේනම් ඒවා නිසි පරිදි හඳුනා ගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනා ගැනීමට නොහැකි අවස්ථාවලදී තක්සේරු කල අගයට ගිණුම්ගත කල යුතු වුවත්, ලේකම් කාර්යාලයට අයත් ඉඩම් 2 ක වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් නොකිරිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ අගය එම වටිනාකමින් ඌණ ගණනය වී තිබූ බව නිරීක්ෂණය විය. තවද, මෙම ඉඩම් වල ඔප්පු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය උප කාර්යාලය හා දියත් මග ස්ථාපිත කරන ලද ඉඩම්, වෙළඳ නාවික ලේකම් කාර්යාලය වෙත පවරන ලද්දේ 2022.11.14 වන දින බැවින්,එම ඉඩම් දෙකෙහි වටිනාකම තක්සේරු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම හේතුවෙන් 2022.12.31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කිරීමට නොහැකි වී ඇති අතර මේ වන විට එම ඉඩම් දෙකෙහි වටිනාකම තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී . | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වූ මඟපෙන්වීම් ප්‍රකාරව ලේකම් කාර්යාලය වත්කම් තක්සේරු අගයට ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු බව. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යාපනය සංචාරක බංගලාව වර්ග මීටර් 277 ප්‍රමාණයෙන් 2 වන මහලේ පිහිටුවා තිබුණද, එය ඉල්ලුම් කරුවන් සඳහා 2020 වර්ෂයේ සිට වෙන්කර දීමට විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් නිෂ්කාර්ය වත්කමක් ලෙස පවතින අතර, ඒ හේතුවෙන් රජයට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | මේ වන විට යාපනය උප කාර්යාලයේ රාජකාරී කටයුතු සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂකවරයෙකු සහ සංවර්ධන නිලධාරියෙකු විසින් සිදු කරනු ලබන අතර, එම කාර්යාලය සඳහා කිසිදු ප්‍රාථමික ශිල්පී ගණයේ සේවකයෙකු අනුයුක්ත කර නොමැත. උප කාර්යාලයේ සංචාරක බංගලාව පවත්වාගෙන යාම තුළින් ආදායම් ඉපැයීම සඳහා වන සේවා අවශ්‍යතාවය සලකා ප්‍රාථමික සේවා ගණයේ බංගලා භාරකරු තනතුරු 01 ක් සහ බංගලා සහායක තනතුරු 01ක් කාර්ය මණ්ඩලය වෙත අනුයුක්ත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ද, බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව වෙතින් හෝ ප්‍රාථමික සේවා ගණයේ පුහුණුලාභීන් දෙදෙනෙකු ඒ සඳහා අනුයුක්ත කර දෙන ලෙස ද ඉල්ලීම් කර ඇත . | අදාල මානව සම්පත සම්පූර්ණ කර ගෙන යාපනය සංචාරක බංගලාව ඉල්ලුම්කරුවන්ට ලබා දී ආදායම් ඉපයීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු බව. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**විගණන නිරීක්ෂණය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 10 | 14 |
| තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| ද්විතියික මට්ටම | 56 | 53 | 03 |
| ප්‍රාථමික මට්ටම | 30 | 03 | 27 |
| 2 | **114** | **67** | **47** |

මේ අනුව 2022 දෙසැම්බර් 31 දිනට ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවක සංඛ්‍යාව සියයට 58 ක් හා ප්‍රාථමික මට්ටමේ සේවක සංඛ්‍යාවේ සියයට 90 ක පුරප්පාඩු පැවතුණි.

**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**

අනුමත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු අතරින් පුරප්පාඩුව පැවති නාවික වෘත්තිකයන්ගේ තනතුරු 05 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට 2022.09.02 වන දිනැති ගැසට් පත්‍රයේ අයදුම්පත් කැඳවීමේ නිවේදන පළ කරන ලදී. .රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව්තට්ටු) තනතුරේ සේවය කළ නිලධාරියා අධ්‍යක්ෂ (නාවික) තනතුරටත්, රාජ්‍ය නෞකා සමීක්ෂක තනතුරේ සේවය කළ නිලධාරියා අධ්‍යක්ෂ (ඉංජිනේරු) තනතුරටත් 2023.02.15 වන දින සිට අභ්‍යන්තර උසස් වීම් මත පත් කරන ලදී.

මේ වන විට අංක 03/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛය අනුව බඳවා ගැනීම් සිදු කළ නොහැක.

අදාල තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමට රාජ්‍ය පරිපාලන ස්වදේශිය කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය මගින් ඉල්ලීම් කර ඇති අතර ඇතැම් තනතුරු සඳහා අනුමත සංඛ්‍යාව වැඩි කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත.

**නිර්දේශය**

ලේකම් කාර්යාලයේ අපේක්ෂිත කාර්යය හා කර්තව්‍යයන් වඩාත් කාර්යක්ෂමව ඉටුකිරීමට මානව සම්පත ප්‍රශස්ථ හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතු බව.